චක්‍ර ලේඛ අංක 3/2018

මගේඅංකය:ස.සේ.කො./5/1/111වෙළුම
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)
කුරුණෑගල.
2018.06.28.

වයඹ පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
ස.ණ.ස. සංගම්,ස.ණ.ස. සමිති,වෙනත් සමිති හා
සංගම් වල ගරු සභාපති/සාමාන්‍යාධිකාරී වරු වෙත,

**සමුපකාර සේවකයින් ලබා ගන්නා වෘත්තීය සුදුසුකම් තනතුරු ලබා ගැනීමේදී උසස් වීමේදී හා වැටුප් වර්ධක ලබා ගැනීමේදී සළකා බලනු ලබන ආකාරය**

සමුපකාර සමිතිවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා සේවකයින් ගේ දැනුම හා අවබෝධය වර්ධනය කරවීමේ අරමුණෙන් හා තමන් දරණ තනතුරුවල අදාළ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කර ගැනීමට හැකි වන ලෙසට අමතර අධ්‍යාපන සුදුසුකම් සළසා ගන්නේ නම් ඒ සඳහා සේවකයින් දිරිමත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් 2/2003 චක්‍ර ලේඛය හා අදාල සුදුසුකම් උසස්වීම් ලබා ගැනීමේදී සළකා බැලීම සම්බන්ධයෙන් 10/2016 දරණ චක්‍රලේඛය නිකුත් කර ඇත.

02.කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන ඉල්ලීම් අනුව මෙම චක්‍රලේඛ විධිවිධාන පරිදි සේවකයකු විසින් අවස්ථා කීපයකදී එකම සුදුසුකම් පදනම් කර ගෙන වරප්‍රසාද භුක්ති විඳින බව පෙනී ගොස් ඇත. එසේ හෙයින් මේ පිළිබඳව සළකා බැලූ කොමිෂන් සභාව ඉහත චක්‍ර ලේඛ සම්බන්ධයෙන් පහත සංශෝධනයන් සිදු කිරීමට නියෝග කර සිටී.

03. යම් සේවකයකු තනතුරකට බඳවා ගැනීම සිදුකර ඇත්තේ ඔහු විසින් ලබා ගන්නා ලද අමතර සුදුසුකම් පදනම් කර ගෙන නම් නැවත එම සුදුසුකම් සළකා උසස්වීම් ලබා නොදීමටත්, ලබා ගන්නා ලද එක් අමතර සුදුසුකමක් බඳවා ගැනීමකදී හෝ එක් උසස්වීමකට හෝ අමතර වැටුප් වර්ධක දීමනා ලබාදීම යන එක් අවස්ථාවක් සඳහා පමණක් සළකා බලනු ලබන බවට කොමිෂන් සභාව නියෝග කරයි.

04.මෙම චක්‍ර ලේඛය කෙරෙහි ඔබගේ දැඩි අවධානය යොමු කරන ලෙස නියෝග කරන අතර ඉදිරියේදී මෙම චක්‍ර ලේඛයේ උපදෙස් වලට පටහැනිව ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙස අවධාරණය කරමි.

05. මෙම චක්‍ර ලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

රේණුකා පී.එපේරුප,
ලේකම්,
සමුපකාර සේවකකොමිෂන් සභාව(වයඹ).

පිටපත්-

1.ප්‍රධාන ලේකම්- වයඹ පළාත
2.ලේකම්,සමුපකාර සංවර්ධන,වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති,ක්‍රීඩා හා යෞවන) කටයුතු,සංස්කෘතික,කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය. ) -කා.දැ.පි.
3.වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් -කා.දැ.පි
4.සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම් වරු -දැ.ගැ.පි
5.සමුපකාර සංවර්ධන උප කොමසාරිස්-කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව -දැ.ගැ.පි.
-දැ.ගැ.පි හා අ.ක.